

**'මා නිවත්ත අභික්කම' - නො නැවත ඉදිරියට යවු**

| 59 වන කාණ්ඩය | බු.ව. 2560 පොසොන් මස පුරපසළොස්වක ද ව්‍ය.ව. 2016 ජූනි මස 19 වන ද | 02 වන කලබ |
|---|---|---|

# මිහිඳු මා හිමි නමඳුව



හෙළි කළ මෙ ලක් දිව බුදු දහමින් නිමල
හෙළ දිව දෙවන බුදු හිමියන් ලෙස පතළ
හෙළ කම බුදුනු කම හා මුසු කළ අතුල
දළ බැති පෙමින් නමඳිමු හිමිපා පතුල

සුමුදු ඉදු ගුණය හෙළ හද තුළ රැඳුණේ
අවිදු මිස අඳුර සම්දිටුවට හැරුණේ
සුසුදු නව හැඟුම් පුබුදන සඳ නැඟුණේ
මිහිඳු හිමි නිසාවෙනි මේ හැම වරුණේ

**- අනඳ**



# වෛරයෙන් වෛරය නො සංසිඳේ

අභිධජ මහා රට්ඨගුරු අතිපූජ්‍ය බළන්ගොඩ
ආනන්ද මෛත්‍රෙය මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසිනි

භාග්‍යවතුන් වහන්සේ කොසඹෑ පුරැ වැඩ ඉන්න සමයෙක එහි භික්ෂූන් දෙ නමක් අතර ඇති වූ අමනාපයක් වැඩී ගොස් දෙ-පසට ම බොහෝ ගිහින් පැවිද්දන් එක් වී මහත් භේදයක් ඇති විය. එය ඇරැබැ ඉවසීමේත් සමගියේත් අගය දක්වනු වස් මේ පහත දැක්වෙන දීඝිති- කෝසල ජාතකය වදළ සේක.

පෙර බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජෙක් විය. ඒ මහ බල සපන් කෙනෙකි. හේ වතාවක් මහ බල සෙනඟ ගෙන කොසොල් රටේ එ-වකට සිටි දීඝීති නම් රජ්ජුරුවන් හා යුද්ධ කරන අදහසින් පිටත්ව ගියේ ය. දීඝීති රජ්ජුරුවනට එතරම් ලොකු යුද හමුදාවෙක් නො වී ය. එ බැවින් හේ පණ බේරා- ගන්න අදහසින්, යුද්ද නො කර ම වෙස් වළා ගෙන බිසොව හා පිරිසර ගමකට ගියේ ය. ගොහින් තමන් සාමාන්‍ය අය හැටියට අඟවා එහි කුඹල් ගෙයෙක වැඩ-පොළ කරදෙමින් ජීවත් විය. මෙයින් බ්‍රහ්මදත්ත රජ යුද්ධ නො කර ම කොසොල් රටත් අත් කර ගත්තේ ය.

කුඹල්ගෙහි වෙස් වළා ඉන්න දීඝීති හිටපු- රජ්ජුරුවනට පුතෙක් ලැබිණ. ඔහුට දීඝායු කියා නම් තැබිණ. ටික කලකට පසු එතුමා ඒ කුමරුවා ශිල්ප-ශාස්ත්‍ර උගන්වන්නට ඈත රටෙක ගුරුවරයකුට බාර දුන්නේ ය. දීඝායු කුමාරයාත් එහි හොඳට ඉගෙන ගනිමින් වැඩුණේ ය.

මෙසේ කලෙක් ම ගත විය. දීඝීති රජු අප්‍රසිද්ධ වේශයෙන් පිටිහරෙක ඉන්න බව බ්‍රහ්මදත්ත රජුට සැලවිය. හේ එතුමා ගැන සැක කොට, තම රාජපුරුෂයන් අමතා "තෙපි ගොස් ඒ රජුත් බිසොවත් දෙදෙනා ම අල්ලා ගෙනවුත් මරා සතරකඩ කොට කපා නුවරින් පිටත වළා ලවු" කියා නියෝග කළේ ය.

රාජ-පුරුෂයෝ ද ගොස් ඒ දෙදෙනා අල්ලා ගෙන වුත් හිස් මුඩුකොට වදමල්දම් පළඳවා වද බෙර ගසමින් වීදියෙන් වීදියට ගෙන ගියහ. මේ අතර ඈත ඉගෙන ගන්නට ගොස් සිටි දීඝායු කුමාරයාත් මාපියන් දක්නා අදහසින් අවුත් ඔවුනට වූ විපත අසා වහා ම ගියේ ය. වද බෙර ගසමින් වධකයන් විසින් ගෙනයන මාපියන් හේ දිටී, තමාට වූ විපත දීඝීති රජ දුටුවේ ය. දැක, "පුතා දීඝායු, දුරට ම බලන්න ළඟ බලන්න එපා. වෛරයෙන් වෛරය සංසිඳෙන්නේ නැතැ"යි කී ය. කුමාරයා එය තේරුම් ගෙන මහත් අමාරුවෙන් ඉවසා නිශ්ශබ්ද විය. 'තමා කවුරුද' යන්න කාටවත් නො ඇඟවී ය. රැස් වූ සේනාවේ කිසි ම කෙනෙකුත් එය දැන නො ගත්තේ ය. එ බැවින් කවුරුත් ඒ රජු මර විකල්ලෙන් නන් දෙඩවනවා යැ'යි සිතූහ. රාජ පුරුෂයෝ ද ඉහත කී පරිදි ඒ රජුත් බිසොවත් නුවරින් ගෙන ගොසින් මරා සතරට කපා කැබෙලි පිට-නුවරැ වළලා දැමූහ. දීඝායු කුමාර රාත්‍රියේ එහි ගොසින් ඒ කැබලි එකතු කොට ආදහන කෙළේ ය.

පියාගේ අවවාදය තදින් හිතට ගත් දීඝායු කුමාර මහත් ඉවසිල්ලෙන් ඈත බලා කටයුතු කරන්නට පටන් ගත්තේ ය.

හේ පසු දිනෙක රජ වාසල ඇත් ගොව්වා හා මිත්‍ර විය. රජගෙට යෑමට ඊමට ද මඟ සලසා ගත්තේ ය. වැඩි කල් නො ගොස් ම ගී ගැයීමෙන් වෙණ වැයීමෙන් රජුට සේවාව කිරීමට රජුගේ නියමය පරිදි හැමදා ම මාලිගාවට යන්නට විය. ටික කලෙකින් හොඳට ම රජුගේ හිත දිනාගත්තේ ය.

මෙසේ කල් යවන අතර, දිනෙක බ්‍රහ්මදත්ත රජ දඩකෙළි සඳහා සෙනඟ සහ නික්මිණ, රජුගේ රිය පැදවූයේ දීඝායු කුමාරයා ය. හේ එය වේගයෙන් පදවා ගෙන පිරිස පසු කොට බෙහෝ ඈත ගියේ ය. බොහෝ දුර ගිය පසු රජ රිය පැත්තෙක නවත්වා, දීඝායු කුමාරයාගේ උකුළේ හිස තබා ගෙන නිද ගත්තේ ය. මේ වේලෙහි දීඝායු කුමාරයාට රජුගෙන් පලි ගන්නට හොඳට ම ඉඩ ප්‍රස්තාව ලැබුණ බව පෙනිණ. 'මගේ රටත් පැහැරගෙන නිරපරාධ මාපියන් ද මැරූ මොහුගෙන් දැන් පලි ගනිමි' යී ඔහුට සිතිණ. ඊළඟට ඔහුගේ අත කඩුව දෙසට යැවිණ. මොහොතෙකින් කඩුව කොපුවෙන් එළියට ඇදිණ. හේ කඩුව දැඩිකොට අල්ලා ගෙන රජුගේ හිසට කෙළින් එසෙවී ය. එවිට ම ඔහුට අන්තිම අවස්ථාවේ දී පියාණන් දුන් අවවාදය 'ළඟ ම බලන්න එපා. ඈතට ම බලාපන්, වෛරයෙන් වෛරය නො සංසිඳේ" යැයි පියා කී වචන සිහි විය. මාපියන්ගේ අවවාදයනට කීකරුව වැඩුණු හොඳ දරුවකු වූ දීඝායු තෙම අදහස වෙනස් කොට කඩුව කොපුව තුළ දැමී ය.

එ කෙණෙහි ම රජ ඩහදියෙන් තෙමුණු සිරුර ඇති වැ තැති ගත් සැටියෙන් පිබිදියේ ය. පිබිදැ, එ කුමරුට තමා නපුරු හීනයක් දැක්ක බව කී ය. "කිමෙක් ද ඒ සීනය

දේවයන් වහන්ස" යි කියා කුමරා රජු අතින් විචාළේ ය. "දීඝීති රජුගේ පුත් වූ දීඝායු නමැත්තකු කඩුවක් ඔසොවා මගේ හිසට ගහන්නට සැරසෙන්නා සේ දිටිමි"යි රජ කී ය.

එවිට දීඝායු කුමාරයා ඒ තාක් තමා රැක ගත් රහස හෙළි කෙළේ ය. "ඒ කියන දීඝායු තමා මම, තුන් විටක් ම ඔබ මරන්න මා කඩුව එසෙවූ නමුත් මපියාණන්ගේ අවවාදයට කීකරුව මා ඔබට ජීවිතය දුන්න බව දැන ගන්නැ"යි කියා සියලු විත්තිය විස්තර කොට කී ය.

බ්‍රහ්මදත්ත රජ එපවත් අසා කුමරු ගැන පැහැදිණ. ඉන් පසු දෙදෙනා එක් වැ ආපසු නුවරට ම ගියහ. මාලිගාවට ගිය එ රජ නොබෝ වේලාවකින් රාජ සභාව රැස් කැරැවී ය. ඉක්බිති "මැතිවරුනි, නැසී ගිය දීඝීති රජ්ජුරුවන් ගේ දීඝායු නම් පුතකු ඉන්නවා ඔහු මෙහි පැමිණියොත් කුමක් කරන්නට යුතු දැ?"යි සභාවෙන් ඇසී ය.

එක් ඇමතියෙක් 'ඔහුගේ අත්- පා සිඳ දැමියැ යුතු යැ'යි කී ය. තව ඇමැතියෙක් 'ඔහුගේ කන් නාසා සිඳ-දැමියැ යුතු යැ'යි කී ය. අන් අය ඔහුට වධ කරන නොයෙක් සැටි ගෙන හැර පෑහ. අන්තිමේදී රජ්ජුරුවන් ළඟ සිටි දීඝායු කුමාරයා ඔවුනට පෙන්වා, ඔහුගේ ගුණ කියා, "මේ මාපියනට කීකරු හොඳ දරුවෙකි. මොහුට මගේ එක ම දියණියන් පාවා දෙමි. මොහුට අයත් කොසොල් - රටේ රාජ්‍යයත් ආපසු බාර දෙමි"යි කී ය.

මෙසේ කියා දියණියන් සරසවා ගෙන්නාලා දීඝායු කුමාරයාට පාවා දී වොටුණු පළඳවා රාජ්‍යය භාර දුන්නේ ය.

(පියාණන්ගේ අවවාදයට නැමීමේ අගය මෙයින් පෙනේ. මාපියනට කළ අපරාධය බරපතළ වුවත්, එයට පළිගන්නට ගියේ නම් නපුරුකමට නපුරුකම් කිරීමෙන් බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් සේ ම එකුමරුත් අපරාධකාරයකු වෙන්නට තිබුණි. පියාණන් කී අවවාදය අනුව පැවතීමෙන් එ කුමරු සතුරාටත් ප්‍රිය විණි. තමාට නැති ව තුබුණු රාජ්‍යයත් ආපසු ලබා ගත්තේ ය.

මෙය හැම කෙනෙකු ම පිළිගත යුතු වටිනා උපදේශයෙකි. බුදුහාමුදුරුවන් වහන්සේ මෙය වදාළේ මෙයින් අපට වටිනා උපදෙස් රැසක් ලබා ගන්නට යි.)

## සඳ මඬල සේ දිලෙන්නට

යෝ ච පුබ්බේ පමජ්ජිත්වා - පච්ඡා සෝ නප්පමජ්ජති

සෝ ඉමං ලෝකං පභාසේති - අබ්භා මුත්තෝ ’ව චන්දිමා

**(ධම්මපදය – ලෝක වග්ගය)**

**අර්ථය**

පමා වී හුන් පෙර යම් කෙනෙක් - කමා වී පස්සේ නොපමා වුවොත්

වලාවෙන් මුත් තරිඳා සෙයින් - මෙලෝ කුස් දුල්වත් නිබඳින් සැණින්



# අනුන් නොරවටන්න

**අග්ගමහාපණ්ඩිත අතිපූජ්‍ය මඩිහේ පඤ්ඤාසීහ මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසිනි**

බරණැස් නුවර විශාල මල් වත්තක් තුබුණේ ය. ඒ මල් වත්ත බලා ගන්නා උයන් පාලකයා හොඳට ගස් සිටුවා පිරිසිදුවට තබා ගැනීම නිසා මල් උයන ඉතා ලස්සන ය. ඒ උයනේ හොඳ පොකුණක් ද වී ය. නෙළුම් මල් මානෙල් මල් පිපිලා ඒ පොකුණ බලන්න ලස්සනයි.

ඒ පළාතේ සිටි සිටු කුමාරවරුන් තුන් දෙනකුන් ඇවිදින්නට ගියේ මේ මල් උයනට ය, පොකුණේ පිපුණු මානෙල් මල් දැකලා හිත ප්‍රීතියෙන් පිරුණා. ඒ නිසා මල් ටිකක් ඉල්ලා ගන්නට කල්පනා කළෝ ය. මල්වත්ත පාලකයාගේ නහය මුක්කන් ය. නාසය නැතුවා වාගේ ය.

වැඩිමහලු කුමාරයා, "යාළුවේ, මට මල් ටිකක් දුන්නොත්, කැපූ රවුල නැවත වැඩෙන්නා සේ ඔබේ නහයත් වැඩේවී, ඒ නිසා මට මල් ටිකක් දෙන්න."

"අනේ මේ ළමයා කියන බොරු, මෙහෙම බොරු නො කියා මල් ටිකක් ඉල්ලුවා නම් දෙනවා නො ව, මගේ නාසය නැවැත වැඩෙන්නේ නැති බව මා දන්නවා නොව?" මෙසේ සිතා උයන් පාලකයා මල් නොදුන්නේ ය.

මද්දුම කුමාරයා, "යාළුවේ කැපූ ගොයම් ආයිත් වැඩෙන්නා සේ ඔබේ නහයත් වැඩෙන්නට නම් මට මල් ටිකක් දෙන්න."

උයන් පාලකයා, "චී! චී! දැන් හැදෙන ළමයින් කියන බොරු" කියා සිතා තවත් හිත නරක් කර ගත්තේ ය.

**බාල කුමාරයා නිතර ඇත්ත කියන අනුන් නොරවටන හොඳ ළමයෙකි.** "අනේ යාළුවේ මල් දුන්නත් නො දුන්නත් ඔබේ නහය නැවැත, වැඩෙන්නේ නැත. මානෙල් මල්වලට මා හරි ආසයි, **කරුණාකර මට මල් ටිකක් දෙන්න.**"

උයන් පාලකයා මේ ඇත්ත කතා කළ බාල කුමාරයාට බොහොම පැහැදුණා. එසේ ම ඉතා සතුටින් මානෙල් මල් පොකුරක් දුන්නේ ය.

**- පදුම ජාතකය**

## ගත යුතු පාඩම

හොඳ ළමයා අනුන් රවටන්නට තබා සෙල්ලමට වත් බොරු නො කියයි. බොරු කියන්නාට හැම දෙනා ම "බොරුකාරයා" කියා නින්දා කරති. හැබැවක් කීවත්, "ඔයා හරි බොරුකාරයා" ය කියා එය බාර නො ගනිති. බොරු කියන්නා ගේ කට ද ගඳ ගසයි.

**ඇත්ත කතා කරන ළමයාට අම්මත් ආදරේ ය, තාත්තත් ආදරේ ය, ගුරුවරුත් ආදරේ ය. තෑගිත් ලැබෙනවා. ඒ නිසා ළමයිනි, නිතර ඇත්ත ම කියන්න. වරදක් කළත් එය සඟවන්නට බොරු නොකියන්න. බොරුකාරයා ය කියා නින්දා ලබනවාට වඩා ඇත්ත කියා බැට කෑම හොඳයි.**

**සියලු සත්ත්වයෝ නිදුක් නිරෝග සුවපත් වෙත්වා!**

**බුදු සසුන බැබළේවා!**



# නොපමා ව නිවනට....

ලැබූ මිනිසත් බව
දුලබ කරුණකි මේ ලොව
වදළෝ ඒ බව
බුදුහු සම්බුදු නැණින් අසමව

ඉපිද මැරෙනා හැටි
නැවත නැවතත් උපත වන හැටි
දුකට පත්වන හැටි
පැහැදිලිව බුදු රදුන් දෙසූ හැටි....!

දනිමි මම සමිඳුනි
වැටහුණේ ඔබ දෙසූ දහමෙනි
හිමි මහිම වැටහිණි
සසර බිය තව තව ද ඇති විණි

කලණ මිතු අතරේ
පමණි වාසය නිතොරේ
නිමක් නැති සසරේ
නො ම රැඳෙමි තව තව ද අතොරේ

සමිඳු බණ පද ගතිමි ගුරු කොට
තබමි පියවර ඒ දම් විලසට
ලැබුණු සුපහන් දිවිය එළිකොට
පමා නො ම වෙමි යන්න නිවනට

**- පොඩි හාමුදුරුවෝ**



# අන්‍යයනට විහිළු කිරීම නො මැනවි.

වජිරාරාමයේ වැඩ විසූ අතිගරු
කොග්ගල රෝහණ මාහිමියන් වහන්සේ විසිනි.

කසුප් බුදුරජුන් සමයෙහි සහෝදර ලීලාවෙන් සමඟියෙන් වාසය කළ මිත්‍ර ස්ථවිරයන් දෙනමක් වූහ. ඒ වහන්දෑ පෝය කිරීම සඳහා යන ගමනේ දී අතර මග කැලෑ රොදක් හමු විය.

එයින් එක නමක් "ඇවැත්නි, මඳක් සිටුව මැනව, ශරීර කෘත්‍ය කරන්නට යමි"යි කියා කැලෑ රොදට වැඩම කරවා එයින් ඉවත් ව එන වෙලාවට එක් දෙවියෙක් සැකයක් ඇති කිරීම පිණිස ගෑනු වෙසක් මවා ගෙන ඒ භික්ෂූන් වහන්සේ ගේ පසු පස්සෙහි ආයේ ය. එහෙත්, ඒ භික්ෂුව ඒ බව නො දනී. යහළු භික්ෂුව ගැහැනු වෙස දුටුවේ ය. දේවතාවා ද යහළු තෙර නමට සැකය ඇති කරවා අතුරුදහන් වී ය.

මග නතර ව සිටි භික්ෂුව "ඇවැත්නි, ඔබ සීල විපත්තියට පැමුණුණාහු දැ යි විචාළේ ය. අනික් භික්ෂුව තමන් ඒ ගැන කිසිත් නොදත් හෙයින් එහෙම එකක් නො වී යයි කී ය. "මොනවා කියනවා ද ඔබ වහන්සේ කැලෑවෙන් එළියට එන විට පසු පස ගැහැනියක් නොසරුප් ලීලායෙන් ආ බව මම දැක්කෙමි". සිරුර කිස සඳහා ගිය තෙරුන්

වහන්සේ "අනේ! හාමුදුරුවනේ සිහිනෙන්වත් එහෙම දෙයක් සිදු නො වූයේ යැ"යි කීහ.

තැනට නොසරිලන නුවමනා විහිළුවේ වරදින් හර ඇති ලීයක් බිඳී ගියා සේ කලක් තිස්සේ පැවති මිතුරු දහම කැඩී බිඳී ගියේ ය. එ පමණකින් නො නැවතිණ. පෝය කිරීම සඳහා සීමා මාලකයට රැස් වූ භික්ෂූන් ඉදිරියේ දී මෙ පුවත කියා ඒ භික්ෂූන් වහන්සේ සමඟ පෝය කරන්නට කැමති නැති බව තරයේ කීහ.

දෙවියා ද නුවමනා විහිළුව කොට එයින් වන ප්‍රතිඵල කුමක් දැ යි බලා සිටියේ ය. සීමා මාලකයේ දී සිදු වූ කථාව අසා, විහිළුවේ වරද වැටහී, "ස්වාමීනි! ඒ ස්වාමීන් වහන්සේගේ සීලයට හානියක් සිදු වූයේ නැත. ඔබ වහන්සේගේ මිතුරු දහමේ පමණ බලන්නට මෙසේ කෙළෙමි"යි දෙවියා අහසෙහි සිට කියා "ස්වාමීනි, පෝය කළ මැනැවැ"යි බැගෑපත්ව ඉල්ලා සිටියේ ය. මෙසේ දේවතාවා අහසේ සිට ඒ තෙරුන් නිදෙස් කළ නිසා ඒ වහන් දැ පොහොය කළහ. එහෙත්, පෙර සේ මිතුරු දහම නො පැවැතිණ. මේ කරුණ නිසා දෙදෙනා වහන්සේට ම මඟ පල ලබා ගත නො හැකි විය. පිරිසිදු සිල්වතුන් වූ බැවින් මැරී දෙව්ලොව උපන්හ.

දෙවියා මැරී අවීචියෙහි ඉපිදැ එක් බුද්ධාන්තරයක් කටුක දුක් වින්දේ ය. අපගේ බුදු සමයෙහි, සැවැත් නුවර ඉපිදැ, මහණ ව මහලු පැවිද්ද ද ලැබී ය. පෙර කරන ලද අකුශලයෙහි (=විහිළුවෙහි) අනිෂ්ට විපාක වශයෙන් එවක් පටන් **කුණ්ඩධාන** නමින් හඳුන්වනු ලැබූ මේ භික්ෂූන් වහන්සේගේ පසුපසැ ගැනු රුවක් සිටිනා සේ පෙනෙයි. මේ දුටු සෙසු භික්ෂූහු සංවේගයට පත්ව, මේ තෙරුන් වහන්සේ

විහාරයෙන් එළවිය යුතු යයි අනේපිඬුසිටාණන්ටත් විශාඛාවන්ටත් දැන්වූ සේක. ඒ දෙපොළ ඊට මැදහත් වන්නට අකමැති ව ඒ කරුණ බුදුරජාණන් වහන්සේට දැන්විය යුතු බව කීහ. භික්ෂූන් වහන්සේ එය බුදුරජාණන් වහන්සේට දන්වන්නට නො ගොස් කොසොල් රජ්ජුරුවන් හමුවී "මහරජ, කුණ්ඩධාන භික්ෂූන්වහන්සේ එක් ගැහැනියක් කැටුව ඇවිදිමින් අනෙක් භික්ෂූන් වහන්සේට ද නින්ද කෙරෙති. ඒ නිසා ඔහු ඔබගේ විජිතයෙන් පහ කරන්න" යයි කීහ. කොසොල් රජතුමා කුණ්ඩධාන තෙරුන් ඉන්නා තැන අසා දැනගෙන භවස්වරුවේ විහාරයට ගොස් උන්වහන්සේ වැඩ ඉන්නා ගෙය වටකොට, රැකවල් ලවා ඒ තෙරුන් වෙත ගියේ ය. ඒ තෙරුන් වහන්සේත් රජ්ජුරුවන් ආ ශබ්දය අසා, උඩමාලයෙන් පාත මාලයට බැස පෙර මාලයේ (=ඉස්තෝප්පුවේ) සිටියහ. ඒ තෙරුන් පිටිපසැ සිටිය ගෑනු රුව රජතුමාත් දුටුවේ ය. තෙරුන් වහන්සේ උඩු මාලයට නැඟී වැඩ හුන්සේක. හෙතෙමේ තෙරුන් වහන්සේ නොවැන්දේ ය. පසුව, ගෑනු රුව නො දැක ඈ ගිය තැන දැන ගන්නට හැම තැන ම සොයා බලා නො දැක, "ස්වාමීනි! මම එන ගමනේ ඔබ වහන්සේ පිටිපසැ ගෑනියක සිටියා දැක්කෙමි. හාමුදුරුවන්ට නොවැන්දේත් එහෙයිනි. දැන් ඒ තැනැත්තී කොහිදැ"යි ඇසුවේ ය. "මහරජ, නුදුටුවම්හ"යි වදාළ සේක. රජ්ජුරුවෝත් කර්ම ස්වරූප නො දන්නා හෙයින් මේ කිම්දැයි සිතා සැක හැර ගැනීම පිණිස "ස්වාමීනි. නැවතත්, පෙර මාලයට වඩින්න" ය යි කීහ. එසේ ගොසින් පෙර මාලේ සිටි කල ගෑනුරුව ඒ භික්ෂූන් වහන්සේ පිටිපසැ නැවතත් පෙනුණේ ය. රජතුමා එය දැක තෙරුන් වහන්සේට නැවතත් උඩමාලයට වඩින්නට කියා තෙරුන් වහන්සේ කැටුව රජ්ජුරුවෝත් උඩමාලය

නැංගාහ. එහි ද ගෑනුරුව නො දැක, හැමතැන ම බලවා නො පෙනෙන හෙයින් "ස්වාමීනි, මෙතැන සිටි ගැහැනිය කොහි දැ"යි විචාළෝ ය. එවිටත් "නුදුටුවම්හ"යි වදාළ සේක. "ස්වාමීනි, කුමක් කියන නියා ද? ඔබ වහන්සේ පිටිපසැ සිටි නියාව, මම හොඳින් දැක්කෙමි". ඔබ වහන්සේ "ඒ රුව නො දකින්නට කාරණා කිම්දැ"යි කීකල්හි 'එසේ ය මහරජ, බොහෝ දෙනා මා කැටුව ගැහැනියක ඇවිදිති යි කියති. එහෙත්, මා දන්නේ නැත. ඊට කරුණ බුදුරජුන් විනා මම නොදනිමි"යි වදාළ සේක. රජ්ජුරුවෝත් මීට කාරණයක් ඇතැයි සිතා "ස්වාමීනි, එම තැන සිටිය මැනවැයි" කියා නැවතත් තෙරුන් වහන්සේ පෙර මාලේ සිටිය වේලාවට ගෑනුරුව පිටිපසැ සිටියා දැක උඩමාලයට නැඟී කලට හැම වේලේ ම තෙරුන් වහන්සේ මුත් ගෑනුරුව නො දැක තවත් තෙරුන් වහන්සේ අතින් විතාරා "මම නුදුටුයෙමි"යි වදාළ කල්හි, රජ්ජුරුවෝ කාරණය වටහා ගෙන නිහඬ වූහ. උන්වහන්සේට ආදරයෙන් උපස්ථාන ද කළහ.

● ● ● ● ● ● ● ● ● ● ● ● ● ● ● ● ● ●

පසුගිය සියවස තුළ ඇති වූ විපත්තිදායක දේශපාලන හා සමාජ විපර්යාස විසින් බුදු සමයට නොවැළැක්විය හැකි උසස් තැනක් ලබාදෙන ලද හෙයින් බුදු සමය සමඟ තරගයට බට අනෙක් මහා ආගම් තුන අසාර්ථක විය. දුබල විය. එහෙයින් තවමත් මනුෂ්‍යයන් ගේ සිත් සතන් පුබුදු කළ හැකි නියම බලයක් සහිත එකම ආගම බුදු සමය පමණි.

**ලෝ සුපතළ විද්‍යා-දාර්ශනික**
**ආතර් සී. ක්ලාක් ශ්‍රීමතාණන් ගේ**
**"ගැඹුරු මුහුද" පරිවර්තන කෘතියෙනි (253 පිටුව)**



# පොසොන් පොහෝද ඇරඹුණු නව සංස්කෘතියක උදව

සිරි වජිරාරාමවාසී
පූජ්‍ය මුල්කිරිගල සුපසන්ත හිමියන් විසිනි

අප තිලෝගුරු භාග්‍යවත් මහා මුනීන්ද්‍රයන් වහන්සේ එදා ඇසළ පුනු පොහෝ දිනයෙක අසිරිමත් දම්සක පවත්වා තුන්ලෝකයට ම දහම් මග විවර කළ බව අපි සැවොම දනිමු. පන්සාළිස් වසක් ගම් නියම්ගම්හි සැරිසරමින් දම් දෙසූ අප තථාගතයන් වහන්සේ වෙසක් පුර පසළොස්වක් පෝ දිනෙක මහා පරිනිර්වාණයට වැඩම කළහ. එතැන් පටන් ශාසන භාරධාරී මහ තෙරුන් වහන්සේලා විසින් බුද්ධ ශාසනය අඛණ්ඩව පවත්වා ගෙන එන ලදි. බුදු සසුනේ අනාගත අභිවෘද්ධිය පිණිස අශෝක මහාධිරාජයා ගේ අනුග්‍රහය පරිදි මොග්ගලීපුත්තතිස්ස මහ රහතන් වහන්සේ ගේ ප්‍රධානත්වයෙන් තෙවන ධර්ම සංගායනාව පවත්වන ලදි. එම සංගායනාවසානයෙහි ධර්ම ප්‍රචාරය කිරීමට උගත් බහුශ්‍රැත මහතෙරුන් වහන්සේලා ගේ ප්‍රධානත්වයෙන් ධර්ම දූත කණ්ඩායම් කිහිපයක් ඒ ඒ රටවලට පිටත් කැර හරින ලදි.

එම රටවල් අතර සුවිශේෂතම රටක් වූ ශ්‍රී ලංකාද්වීපය සඳහා මහා මහින්ද තෙරණුවන් ගේ ප්‍රධානත්වයෙන් ස්වාමීන් වහන්සේලා පස් නමක් වැඩියහ. එකල ශ්‍රී ලංකාද්වීපය කැරවූවෝ දෙවනපියතිස් මහරජතුමාණෝ ය. ඒ ක්‍රි. පූ. 236

වැන්නෙහි ය. ධර්ම ප්‍රචාරයෙහි ලා අනුග්‍රහය දැක්වූ අශෝක මහාධිරාජයා ලංකාව පිළිබඳ වැඩි අවධානයක් යොමු කැර ඇති බව පෙනේ. තමන් ගේ අතිජාත පුත්‍ර රත්නය වූ මහින්ද තෙරණුවෝ මෙහි ධර්ම ප්‍රචාරය පිණිස පිටත් කැර එවීම ලංකාව පිළිබඳ දැක්වූ විශේෂ සැලකිල්ලක් බව සිතිය හැකි ය. එදා සිට ම ලෝ සුපතළ රාජ්‍යයක් වූ ශ්‍රී ලංකාවෙහි සභ්‍යත්වය සංස්කෘතිය ප්‍රතිනිර්මාණය කිරීමෙහිලා මහා මහින්ද තෙරණුවන් සිදු කළ කාර්යභාරය අතිමහත් ය. එය ලංකාවේ රාජ්‍ය පාලනය, ජන ජීවිතය, සමාජීය සංස්කෘතික සංවර්ධනය, විමුක්ති සාක්ෂාත් කරණය, අධ්‍යාපනය ආදී විවිධ ක්ෂේත්‍රයන් සඳහා වෙසෙසින් බල පැවැත්වී ය. එහෙයින් උන්වහන්සේ ශ්‍රී ලංකා බෞද්ධ සංස්කෘතියේ නිර්මාතෘවරයාණෝ ය.

මිහිඳු මාහිමියෝ මෙහි වඩනා කල්හි ලක්දිව්හි අගරජ වූ තිස්ස රජු මුව දඩයමෙහි නිරත ව සිටි බව අප සැවොම දන්නා කාරණයෙකි. මුව දඩයමෙහි යෙදී සිටි රජතුමාට මිහිඳු හිමියන් කළ ආමන්ත්‍රණයත් සමඟ දුනු හී අතින් ගිලිහිණ. එදා පටන් ලක්වැසි වූ තිරිසන් සතුන්ට පවා බුදු දහමේ ආලෝකයෙන් අභය ලැබුණි. එ මාහිමියෝ රජුගේ නුවණ පිරික්සීමට ප්‍රශ්න කිහිපයක් අසා රජු ඥානවන්ත බැව් දැන චුල්ලහත්ථිපදෝපම සූත්‍රයෙන් දහම් දෙසූහ. එතැන් පටන් ලක් රජු බෞද්ධයකු වූවා පමණක් නොව ලංකාවෙහි දස රාජ ධර්මයෙන් රට පාලනය වන නව යුගයක් ද ආරම්භ කළ බව කිව යුතු ය.

මිහිඳු මාහිමියෝ පළමුව ලක් ජනතාවට පේතවත්‍ථු, විමානවත්‍ථු ඇසුරෙන් දහම් දෙසූහ. ඒ ඇසූ බොහෝ ලක්වැසියෝ පවින් ඈත් වූහ. පිනට නැඹුරු වූහ. පසුව බාලපණ්ඩිත, සච්ච සංයුත්ත, ආසිවිසෝපම, ධම්මචක්කාදී සූත්‍ර දේශනාවලින් පිළිවෙලින් දහම් දෙසූහ. එය ලක්වැසියන්

ගේ ආධ්‍යාත්මික සංවර්ධනයට මෙන්ම ලෞකික ජීවිතය යහපත් කැරගැනීම පිණිස ද මනා පිටිවහලක් විය. එහෙයින් ලක්වැසියෝ උන් වහන්සේ "අනුබුදු" යන අපර නාමයෙකින් හැඳින්වූහ. තථාගත ශ්‍රී පාදස්පර්ශයෙන් සුපරිශුද්ධත්වයට පත් වූ ලක්දිව මිහිඳු හිමියන් ගේ ධර්ම ප්‍රචාරයත් සමඟ තව තවත් බැබළෙන්නට විය. මිහිඳු හිමියන් ගේ අනුශාසනයෙන් ථේරවාදයේ මූලස්ථානය වූ අනුරපුර මහාවිහාරය ඉදිවිය. එහිදී අරිට්ඨ කුමරු ඇතුළු බොහෝ කුලපුත්හු තමාගේ විමුක්තිය උදෙසා පැවිදි දිවියට ඇතුළත් වූහ. එතැන් පටන් ලක්දිව බුදු සසුන මුල් බැස ගත්තේ ය. පසුව ලංකාවේ සෑම තන්හි ම වෙහෙර විහාර කරවා සිංහල භික්ෂු පරම්පරාව ඇති කොට ලංකා බුද්ධ ශාසනය තව තවත් ශක්තිමත් කළහ. ඒ හිමියන් ගේ අනුශාසනාවෙන් මහා අරිට්ඨ ආදී මහ තෙරුන්වහන්සේලා ද, අනුලා ආදී මහ තෙරණිවරු ද දුටුගැමුණු ආදී ප්‍රතාපවත් සිංහල රජවරු ද නන්දිමිත්‍ර, ථෙරපුත්තාභය ආදී දේශප්‍රේමී සෙන්පතියෝ ද ලක්දිවිහි බොහෝ සෙයින් පහළ වූහ. අද ද අප ලෝකයේ කීර්තිමත් රාජ්‍යයක් වන්නේ ද, ලොව මවිත කරන වැව් අමුණු වෙහෙර විහාරවලින් පෝෂිත අපරාජිත සභ්‍යත්වයකට උරුමකම් කියන්නේ ද මිහිඳු හිමියන් ගේ විශිෂ්ට අනුශාසනාව නිසා ම ය. මේ සිංහලය තුළ උපදින සෑම මිනිසෙක් ම ඒ මහ රහතන් වහන්සේට ණය ගැති වන්නේ ය. බුදු සසුන උදෙසා ලංකාද්වීපය පූජා කිරීමට තරම් ශ්‍රද්ධාව දියුණු කොට ගත් නරපතියන් ගේ ද ලක්වැසියන් ගේ ද චිත්ත සංවර්ධනය උදෙසා අනුපමේය සේවයක් ඉටුකරන ලද මහා මහින්ද රහතන් වහන්සේ සැබැවින් ම "අනුබුදු" මැ වන සේක. උන් වහන්සේ නිසා ඇති වූ නව සමාජ-සංස්කෘතික පරිවර්තනය හුදෙක් මිහිඳු සංස්කෘතිය ලෙස ම හැඳින්වීම ඉතා නිවැරදි ය.



# පන්සිල් සුරකිමු

කොළඹ ලුම්බිණි විද්‍යාලයේ විශ්‍රාමික ආචාර්යාණි
ශ්‍රියාණි චිත්‍රා ජයලත් නැන්ද

තම පණ මෙන් සිතා
අනුනට කුලුණු මෙත පා
සියල් සිත් සනසා
සතුන් නො මරමු නො දෙමු වෙහෙසා

අනුන් සතු දෙයකට
වැරදි ලෙස ආසා කොට
නුසුදුසු ය ගැනුමට
සොරකමක් ඉන් නො වේ අප හට

වැරදි හැසිරීමෙන්
වැළකී දිවි ගෙවීමෙන්
කුසලය වැඩීමෙන්
සීල ගුණ සපිරේ ය නිතැතින්

අනුන් රැවටීමට
ඔවුන් සිත් ඇද ගැනුමට
නො ගොස් ඇත්තෙහි සිට
මුසාවෙන් තොරවන්න හැමවිට

වෙයි සිහි මොළ විකර
බිව්ව හොත් මත් දිය සැර
ඉන් වැළකී මිතුර
ලබනු ජය ඔබ දිනා මෙ සසර



# තිපල්ලත්ථමිග ජාතකය

**සිරි වජිරාරාම දහම් පාසලේ ආදි ශිෂ්‍යා**
**දිලිනි ජයවර්ධන අක්කා.**

ආදර දුවේ පුතේ, අද අප තිපල්ලත්ථමිග ජාතකයෙන් ගෙන හැර දක්වන්නට සූදනම් වන්නේ ගුරුවරුන්ට කීකරුව මනාකොට ශාස්ත්‍රය හදරන තැනැත්තා කිසිදක විපතකට පත් නොවන බව කියා දීමට යි. මේ ජාතක කතාව අපේ තිලෝගුරු සම්මා සම්බුදුරජාණන් වහන්සේ දේශනා කොට ඇත්තේ හික්මීමේ දැඩි ආසා ඇති රාහුල හාමුදුරුවන් අරබයා යි.

එක් කලෙක බුදු පියාණන් වහන්සේ අලව් නුවර අග්ගාලව නම් විහාරයෙහි වැඩ වසන සමයෙහි රාත්‍රියේ බණ ඇසීමෙන් පසු භික්ෂු උපාසක, සාමණේර පිරිස එකට නිදගැනීමේ විප්‍රකාරය දුටු භික්ෂූන් වහන්සේලා බුදු රජුන් හට මෙය දැන්වීමෙන් පසු උන්වහන්සේ, උපසපන් භික්ෂූන් වහන්සේ උපසපන් නොවූවන් සමඟ එක කුටියෙහි නිද නො ගතයුතු යැයි විනය නීතියක් පැනවූහ.

මේ හේතුව නිසාවෙන් දිනක් රාහුල සාමණේරයන් වහන්සේට කොසඹෑ නුවර විහාරයක දී වෙනද මෙන් සංග්‍රහ නො ලැබිණි. භික්ෂුවකගේ කාමරයෙහි නිද ගැනීමට ද අවසර නො ලැබිණි. බුදුන් වහන්සේ ගේ, ආනන්ද

හාමුදුරුවන් වහන්සේ ගේ, සැරියුත් මහ තෙරුන් වහන්සේ ගේ හෝ මුගලන් මහ තෙරුන් වහන්සේ ගේ සමීපයට ගොස් සිටිය හැකි වුවත්, රාහුල හාමුදුරුවන් වහන්සේ වැඩිහිටි භික්ෂූන් ගේ සිත රිදවීමට නොකැමති වූහ. උන්වහන්සේ බුදු රජුන්ගේ වැසිකිළියෙහි එදින රාත්‍රිය පහන් කළහ. පසුවද අලුයම් කාලයේ මේ බව දැක ගත් භාග්‍යවතුන් වහන්සේ පැවිදි බවට පත් බාල කුල දරුවන්ට මෙලෙස සැලකීම සුදුසු නැතැයි සිතා ධර්ම සංවේගයට පැමිණ භික්ෂූන් රැ ස් කරවා අනුප්‍රඥප්තියක් ලෙස 'උපසපන් අය උපසපන් නොවූ අය සමඟ දෙදිනක් පමණක් නිදා ගත හැකි' බවට ශික්ෂාපදයක් පැණවූ සේක.

දිනක් දම්සබා මණ්ඩපයට වැඩි අප මහා සර්වඥයන් වහන්සේ, භික්ෂූන් වහන්සේලා ගේ ගුණ කථනය ශික්ෂාකාමී රාහුල සාමණේරයන් වහන්සේ පිළිබඳ බව දැන, මේ පුංචි රාහුල හාමුදුරුවෝ දැන් පමණක් නොව පෙර භවයක දී සිවුපා සතකු වී ඉපිද ඒ කාලයේ දීත් ශික්ෂාකාමී වූහ යි අතීත කථා වස්තුව වදාළ සේක.

එක් සමයක රජගහ නුවර එක් මගධ රජ කෙනෙකුන් රාජ්‍ය කරන කාලයක අපේ මහා බෝසතාණන් වහන්සේ මුව ජාතියෙහි ඉපදී මුවන් සමඟ වාසය කළහ. එක් දවසක බෝසතාණන් වහන්සේගේ නැගණිය තම පුත්‍රයාට, මුව වැද්දන් ගේ උවදුරු වලින් බේරීයෑමේ මුව මායම් උගන්වන ලෙස ඉල්ලා සිටියා ය. ඉක්බිති ඒ බෝසත් මුවා තම බෑනණු මුවාට සියලු මුව මායම් ඉගැන්වූයේ ය. බෑනණු මුවා ද තම මාමා හට කීකරු ව, අවනත ව, නියමිත කලට වේලාවට ගොස් සියලු මුව මායම් ඉගැන්වූයේ ය. බෑනණු මුවා ද තම මාමා හට කීකරු ව, අවනත ව, නියමිත කලට වේලාවට

ගොස් සියලු මුව මායම් උගත්තේ ය. දිනක් මේ බෑනණු මුවා වනයේ සැරිසරන අතරේ වැද්දකුගේ මර උගුලකට හසු විය. ඔහුගේ කෑගැසීමෙන් උගුලක හසු වූ බව දැනගත් මුව රංචුව ඒ බව මවට දිව ගොස් කීහ. මව වහාම දිව ගොස් මේ බව තම සොයුරු බෝසත් මුවා හට කියා වැලපුණ ද ඔහු කළේ තම බෑනණුවන් මනාව මුව මායම් උගත් බවත්, ඔහු සුළු වේලාවකින් මුව වැද්දාගෙන් බේරී එන බවත් කියා තම නැගණිය සැනසීමයි. බෝසතාණන් වහන්සේ කී ලෙස ම උගුලෙහි ගැටී සිටි මුවා අත්පා දරදඬු කරවා මළමුත්‍ර පිටකර, උදරය ද පුම්බා මැරුණාක් මෙන් වැතිරී සිටියේ ය. වැද්දා උගුල ගලවා කොළ කඩාගෙන ඒමට ගිය වහා ම හේ එතැනින් පැන මව වෙත දිව ආවේ ය.

එකල ඒ කීකරු ව, අවනත ව, කලට වේලාවට මනාව තම ශාස්ත්‍රය ඉගෙනගත් බෑනණු මුවා රාහුල සාමණේරයන් වහන්සේ ම ය. ඉතින් දුවේ පුතේ, අපත් සැම විට ම අපගේ ගුරු මව්වරුන්ට හා ගුරු පියවරුන්ට කීකරුව ඔවුන්ගේ සිත් නොරිදවා ඔවුන්ගේ බසට අවනත ව අනතිමානී ව අකුරු ඉගෙනීමට අදිටන් කර ගනිමු.

**තෙරුවන් සරණයි !**